# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි අවසාන පරීක්ෂණය, තෙවන වසර 2018/2019

## පොදු අන්තර්ජාතික නීතිය

(පැය තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 07

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

1. "අන්තර්ජාතික නීතිය සකස් වීම සඳහා සෑම රාජ්‍යයක්ම, සෑම අවස්ථාවකදීම තම අනුමැතිය දිය යුතුය යන්න රාජ්‍ය අනුමැතිය යන්නෙන් අනුමිත නොවේ. සාමාන්‍යයෙන් බහුතර රාජ්‍යයන්හි අනුමැතිය පැවතීම ප්‍රමාණවත් වේ. ඇතැම් අවස්ථාවලදී පමණක් රාජ්‍ය අනුමැතිය අතිශයින්ම වැදගත් වන බව තර්ක කළ හැකි නමුත් අන්තර්ජාතික නීතියේ ඇතැම් නිශ්චිත අංශවලදී එය ප්‍රායෝගික වශයෙන් අදාළ නොවේ."

   අදාළ නිදසුන් ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

2. "අන්තර්ජාතික රීති සහ නියාමයන් ඇතැම් අවස්ථාවලදී නොපැවතීම, විවාදාත්මක වීම හෝ බලාත්මක නොවීම දක්නට ලැබෙන අතර එබැවින් රාජ්‍යයන් මෙන්ම රාජ්‍ය නොවන ආස්ථිත්ත්වයන් (entities) සහ තැනැත්තන් අන්තර්ජාතික පද්ධතියේ පවතින තත්කාලීන අවිනිශ්චිතභාවයන්ගෙන් ප්‍රයෝජන ලබා ගැනීම සඳහා අවස්ථාවන් සොයති."

   අන්තර්ජාතික තලයේ ඇති විවිධාකාර පාත්‍ර වර්ගයා (actors) හඳුනා ගනිමින්, යටත් පිරිසෙන් අන්තර්ජාතික නීතියේ තෝරාගත් එක් විශේෂිත නීති ප්‍රදේශයක තිබෙන

අන්තර්ජාතික නීති නියාමයන් සහ ප්‍රමිතීන් මෙම පාත්‍ර වර්ගයා කෙරෙහි යෙදෙන ආකාරය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

3. 1965 දී ස්වාධීනත්වය ලැබුදා පටන් යාෂියාන් රාජ්‍යය අන්තර්ජාතික ගිවිසුම්වලට නිදහසේ එළඹුනු අතර, යාෂියාන් ආණ්ඩුව ද අන්තර්ජාතික සංසදවලදී අන්තර්ජාතික නියාම සහ ප්‍රමිතීන්වලට සහයෝගය පළ කොට තිබේ. කෙසේ වුවද, අන්තර්ජාතික නීතිය දේශීය නීතිය තුළට ඇතුළත් කර ගන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් යාෂියානු නීති පද්ධතියේ කිසිදු පැහැදිලි මග පෙන්වීමක් නොමැති හෙයින් මෙම කරුණ සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයේ සහ විධායකයේ පරිචයන් බෙහෙවින්ම පරස්පර විරෝධී වේ. මෙම ව්‍යාකූලභාවය හේතුවෙන් අන්තර්ජාතික සංසදයන්හිදී යාෂියාන් රාජ්‍යය දරනු ලබන ස්ථාවරයේ ප්‍රායෝගික වටිනාකම සම්බන්ධයෙන් බරපතල සැක සංකා මතුවී තිබේ.

අන්තර්ජාතික ප්‍රජාව සහ රට තුළ නීති ප්‍රතිසංස්කරණ ඇති කිරීම සඳහා බලපෑම් කරන දේශීය සිවිල් සමාජ සංවිධාන විසින් තම අන්තර්ජාතික බැඳීම් භාර ගැනීම සහ ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලෙස යාෂියාන් ආණ්ඩුවෙන් ඉල්ලා සිටිති. උක්ත කරුණ සම්බන්ධයෙන් අනාගතයේ දී යාෂියාන් හි ස්ථාවරය කුමක් විය යුතුය යන්න සම්බන්ධයෙන් ලිඛිත අදහස් ඉදිරිපත් කරන මෙන් ජාතික නීති කොමිෂන් සභාව මහජනයාගෙන් ඉල්ලා තිබේ.

ඔබ, රට තුළ අන්තර්ජාතික නීතිය බලාත්මක කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන යාෂියානු රාජ්‍යයේ ජීවත් වන තරුණ නීති විද්‍යාර්ථියෙකු යැයි උපකල්පනය කරමින් ඔබේ අදහස් අනුව අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ආකාර සහ ක්‍රමවේද පිළිබඳ නිශ්චිත නිර්දේශ ඉදිරිපත් කරමින් ලිඛිතව අදහස් දක්වන්න. න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික යන අංශ දෙකම සම්බන්ධ විශ්ලේෂණයක් ඔබේ ලිඛිත ඉදිරිපත් කිරීම තුළ අන්තර්ගත විය යුතුය.

4. (අ) සහ (ආ) යන දෙකටම පිළිතුරු සපයන්න.

(අ) සොමියානු සාගරයේ උපාය මාර්ගිකව පිහිටා තිබෙන දූපත් රාජ්‍යයක් වන ඊසිලන්තය දේශීය බෙදුම්වාදී ව්‍යාපාරයක් සමග දශක ගණනාවක් තිස්සේ යුද ගැටුමක

නිරතව සිටි අතර දැන් එය දේශපාලනික සහ ආර්ථික වශයෙන් යථා තත්ත්වයට පත් වෙමින් සිටියි. කලාපීය ආරක්ෂාව සහ සහයෝගීතාවය පිළිබඳ විශේෂිත කාරණා සම්බන්ධ ගිවිසුමක් මෑතකදී ඊසිලන්තය සහ ඇනොටිකා රාජ්‍යය අතර ඇති කර ගෙන තිබේ. ගිවිසුමේ 6 වන වගන්තිය පහත පරිදි වේ.

"අපේක්ෂිත හෝ සිදුවිය හැකි හදිසි අවස්ථා තත්ත්වයකදී නම් කරන ලද තම නියෝජිතයන් හට තම දේශභූමි තුළට නිදහසේ ප්‍රවේශ වීම සඳහා ඉඩදීමට පාර්ශවයන් එකඟ වන අතර එබඳු ප්‍රවේශවීම්වලට කිසිදු අතිරේක අවශ්‍යතා සම්පූර්ණ කිරීමක් අවශ්‍ය නොවේ. එබඳු හදිසි අවස්ථා තත්ත්වයකදී පාර්ශවයන් හෝ ඔවුන්ගේ නම් කරන ලද නියෝජිතයන් දෙරටේ දේශීය අධිකරණවල හෝ දේශීය නීති බලාත්මක කරන අනෙකුත් අධිකාරීන්ගේ අධිකරණ බලයෙන් විනිර්මුක්ත වේ."

මෙම ගිවිසුමට එරෙහිව ඊසිලන්ත දේශප්‍රේමී ව්‍යාපාරය ප්‍රබල විරෝධයක් දක්වන අතර, ගිවිසුමේ 6 වන වගන්තිය මගින් ඊසිලන්තයේ ස්වෛරීභාවය පාවාදීමක් සිදුවේද යන්න දැන ගැනීමට එයට අවශ්‍යව තිබේ. මෙම සිදුවීම හා සම්බන්ධ අධිකරණබලය (jurisdiction) පිළිබඳ කරුණු හුවා දක්වමින් ඔබේ අදහස් අඩංගු පත්‍රිකාවක් (opinion paper) ඉදිරිපත් කරන්න.

(ආ) 1961 තානාපති සබඳතා පිළිබඳ වියානා සම්මුතිය අංග සම්පූර්ණ නීති දේහයක් ලෙස සලකනු ලැබුව ද, තානාපති සම්බන්ධතාවලට අදාළ විවිධ ක්‍රියාකාරකම් සහ නොයෙකුත් තැනැත්තන් ආවරණය කිරීමට යාමේදී තානාපති විනිර්මුක්තිය පිළිබඳ නීතිය ප්‍රායෝගික වශයෙන් මතුවෙමින් පවතින නොයෙකුත් අභියෝග සහ බාධක රැසකට මුහුණ පාමින් සිටියි.

1961 තානාපති සබඳතා පිළිබඳ වියානා සම්මුතිය යාවත්කාලීන කළ හැක්කේ කෙසේද යන්න ඉහත යෝජනා සහ මෑතකාලීන සිදුවීම් හා නිර්දේශිත යෝජනා පවතී නම් ඒවා කෙරෙහි ද විශේෂ අවධානය සහිතව සාකච්ඡා කරන්න.

5. "අන්තර්ජාතික අර්බුද සාමකාමීව විසඳා ගැනීම අන්තර්ජාතික නීතියේ අනුලංඝනීය ස්වභාවයක් සහිත මූලික සිද්ධාන්තයකි. දැන් මෙම සිද්ධාන්තය එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය තුළට ඇතුළත් කර තිබෙන අතර රාජ්‍යයන් විසින් තම පරිචයන් හරහා ද එය තවදුරටත් වර්ධනය කර තිබේ."

අන්තර්ජාතික අර්බුද සාමකාමීව විසඳා ගැනීම පිළිබඳ අන්තර්ජාතික නීති රාමුව විවේචනාත්මකව විභාග කරමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. තත්කාලීන සිදුවීම් කෙරෙහි විශේෂ අවධානය සහිතව සාමකාමීව අර්බුද නිරාකරණය කරන ආකාරය පිළිබඳ අදාළ නිදසුන් උපුටා දක්වමින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

6. රෝමියෝ රාජ්‍යය ජුලියෙට් රාජ්‍යයත් සමග CHAIR නමින් ද්විපාර්ශවික ආරක්ෂක ගිවිසුමක් ඇති කර ගැනීමට අදහස් කරයි. CHAIR ගිවිසුම අත්සන් කළහොත් රෝමියෝ යුද හමුදාවට ඕනෑම අවස්ථාවකදී පූර්ව අවසර ලබා ගැනීමකින් තොරව ආයුධ සහිතව ජුලියෙට් වෙත පැමිණිය හැකි බවත්, එමගින් ජුලියෙට් හි භෞමික අඛණ්ඩතාවය සහ දේශපාලනික ස්වාධිනත්වය උල්ලංඝනය වීමට ඉඩ ඇති බවත් CHAIR ගිවිසුමේ ඇතැම් වගන්ති විවේචනය කරමින් නීති උපදේශකයෝ සහ විරුද්ධ දේශපාලන පක්ෂ කියා සිටිති.

ජුලියෙට් ආණ්ඩුව ගිවිසුම අත්සන් කිරීමේ අදහස අතහැර දමයි. ඉන් කුපිත වන රෝමියෝ, ජුලියෙට් රාජ්‍යයේ දේශීය ජල තීරය ආසන්නයට යුද නැව් 10ක් යවයි. මෙම යාත්‍රා තම මිසයිල අත්හදා බැලීමේ අභ්‍යාසවල නිරත වන අතර ඇතැම් මිසයිල මහ මුහුද දෙසට විදියි. රෝමියෝට අයත් යුද නැව්වලට බෝම්බ හෙලන මෙන් ජුලියෙට්හි හමුදාවේ ඒකාබද්ධ හමුදාපති තම ගුවන් හමුදාවට අණ කරයි. ප්‍රහාර ගණනාවකින් පසු යුද නැව් පහක් විනාශ වෙයි. කලාපයේ සාමය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පියවර ගැනීමට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය අදහස් කරයි. කෙසේ වුවද, රෝමියෝ සහ ජුලියෙට් අතර යුද ගැටුම තවදුරටත් සිදු වේ.

ආරක්ෂක මණ්ඩලයේ සභාපතිවරයාට ඔබේ මතය දක්වන පත්‍රිකාවක් ඉදිරිපත් කරන මෙන් ඔබට ආරාධනයක් ලැබුණොත් ඔබේ තර්ක ඔබ ඉදිරිපත් කරන්නේ කෙසේද? ඔබේ මත දැක්වීමට ආධාරයක් ලෙස නීති ප්‍රතිපාදන, නඩු තීන්දු, ආරක්ෂක මණ්ඩලය විසින් පෙරදී සම්මත කර ඇති යෝජනා සම්මතයන් සහ මේ හා සමාන රාජ්‍ය ගැටලු පිළිබඳ නිදසුන් ඔබේ ලේඛනයට ඇතුළත් කරන්න.

7. නීල සාගර කලාපයේ (BO) පිහිටා තිබෙන සිනමොනිකා රාජ්‍යය 2019 රග්බි කුසලානය තරගාවලිය සඳහා සත්කාරත්වය දරයි. BO කලාපයේ රටවල්වලින්

කණ්ඩායම් හතක් සිනමොනිකාවට පැමිණ තිබේ. ජින්ජර්න් රාජ්‍යයෙන් පැමිණි රග්බි කණ්ඩායමේ සාමාජිකයන්ගෙන් බහුතරයක් සතුස්ටි ආගමේ මධ්‍යස්ථ මතධාරී නිකායක් ලෙස සැලකෙන පීස් භක්තිකයෝ වෙති.

2019 කලාපීය රග්බි කුසලාන තරගාවලියේ සමාරම්භක දිනයේ දී බෝම්බ ගණනාවක් පුපුරුවා හැරීමට SISI නමැති ජාත්‍යන්තර ත්‍රස්තවාදී කල්ලියක උසිගැන්වීම යටතේ සමාජ් නමැති සතුස්ටි ආගමේ අන්තවාදී පිරිසක් සැලසුම් කරති. රග්බි කණ්ඩායම් සියල්ලටම තරු පහේ හෝටල්වල නවාතැන් පහසුකම් සලසා තිබේ. සමාරම්භක දින උදෑසන පළමු බෝම්බය ජින්ජර්න් කණ්ඩායම නවාතැන් ගෙන සිටි හෝටලයේ භෝජන ශාලාව තුළ පුපුරා යයි. මෙම පිපිරීම සිදුවන අවස්ථාවේදී ඇතැම් ක්‍රීඩකයන් තම උදේ ආහාරය ගනිමින් සිටි අතර, ක්‍රීඩකයන් දෙදෙනෙක් එම ස්ථානයේදීම මිය යයි. තවත් ක්‍රීඩකයන් තිදෙනෙක් බරපතල තුවාල ලබන අතර, ඔවුහු සදාකාලික ආබාධිතයන් බවට පත් වෙති. තවත් බෝම්බයක් සමාරම්භක උත්සවය පැවැත්වෙන අවස්ථාවේදී ක්‍රීඩාංගනය තුළ පිපිරෙන අතර එමගින් තුන්සීයකට අධික දේශීය නරඹන්නන් සහ කලාපයෙන් පැමිණි විදේශිකයන් පනහක් පමණ මරණයට පත් වෙති. ප්‍රහාරවල වගකීම සමාජ් කණ්ඩායම විසින් භාර ගන්නා ලද අතර එම ආගමික මතවාදවලට සහයෝගය දක්වනු වස් සමාජ් විසින් මෙම බෝම්බ පිපිරවීම් සිදු කළ බව ඔවුන්ට අන්තර්ජාතික තලයේ සිට සහයෝගය දක්වන SISI කණ්ඩායම තහවුරු කරයි. සිනමොනිකාවේ පොලිස්පති, පීස් සහ සමාජ් යන ආගමික මතවාද දෙකම සම්බන්ධයෙන් තදබල විවේචන සිදු කරන අතර ඔහු ජින්ජර්න් රාජ්‍යයට ද චෝදනා නගයි. සිනමොනිකාවේ බුද්ධි අංශ සිනමොනිකා ආණ්ඩුවට මෙම ප්‍රහාර සිදුවිය හැකි බවට කල්වේලා ඇතිව තොරතුරු දන්වා තිබූ බව මාධ්‍ය වාර්තා අනාවරණය කරයි.

ඉහත ප්‍රහාර හේතුකොට ගෙන තමන් මුහුණ දුන් භෞතික සහ චිත්තවේගාත්මක හානි පූරණය කර ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට ජින්ජර්න් අදහස් කරයි. ඔබ සිනමොනිකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති උපදේශකවරයා යැයි උපකල්පනය කරමින් ඔබේ නෛතික උපදේශය අමාත්‍යාංශය වෙත ලියා දක්වන්න.

-------------- ----------------